ලංකාදීප



# මිලින්ද මොරගොඩ ඉන්දීය ජාතික ආරක්ෂක උපදේශක හමුවී....

ඉන්දීය රජයේ නිල ආරාධනාවකට අනුව ජනාධිපති උපදේශක මිලින්ද මොරගොඩ මහතා ජනපති මහින්ද රාජපක්ෂ මහතාගේ විශේෂ නියෝජිතයකු ලෙස ඉකුත් සති අන්තයේ දී නවදිල්ලි අගනුවර සංචාරයකට එක් විය.

එහි දී ඔහු ඉන්දීය ජාතික ආරක්ෂක උපදේශක ශ්‍රී ශිවසංකර් මෙනන්, විදේශ ලේකම් සුජාතා සිං, ඉන්දීය පාලක කොංග්‍රස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් වන ප්‍රදේශීය සංවර්ධන ඇමැති ජයිරාම් රමේෂ්, ඉන්දීය ජාතික කොංග්‍රසයේ මහ ලේකම් දිග්විජේ සහ වාණිජ හා කර්මාන්ත ඇමැති ආචාර්ය ඊ.එම්.එස්. වට්චියාපන් යන මහත්ම මහත්මීන් හමුවී සාකච්ඡා පැවැත්විය.

මිලින්ද මොරගොඩ මහතා ඉන්දීය ජාතික ආරක්ෂක උපදේශක ශ්‍රී ශිවසංකර් මෙනන් මහතා හමුවී සාකච්ඡා පැවැත්වීමෙන් පසු ඡායාරූපයකට පෙනී සිටි අවස්ථාවයි මේ.